# නැගෙනහිර පළාත් සභා සංවර්ධන සැසිය

## *අම්පාර දිස්ත්‍රික් රැස්වීම් වාර්තාව*

ස්ථානය : TFC මණ්ඩපය, අක්කරෙයිපත්තු

දිනය : 29.07.2013

සහභාගිවූවන් : නාමලේඛනය මේ සමග අමුණා ඇත.

### 1. පිළිගැනීමේ කතාව හා හැඳින්වීම

පළාත් සංවර්ධන සැසිවාරයේ අම්පාර දිස්ත්‍රික් රැස්වීම ආරම්භ කරමින් පිළිගැනීමේ කතාව ඉදිරිපත් කළ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් තුමා එම රැස්වීමට සහභාගී වී සිටි ගරු ප්‍රධාන අමාත්‍යතුමන්, පළාත් අමාත්‍යවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතන සභාපතිවරුන්, ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා නිළධාරින් පිළිගත් අතර පළාත් සංවර්ධන සැසිවාරයේ දිස්ත්‍රික් රැස්වීම් සූදානම්කිරීමේ අරමුණු පැහැදිලි කළේය.

එසේම මෙවැනි දිස්ත්‍රික් රැස්වීම් මගින් සංවර්ධන සැලසුම් ක්‍රියාවලියේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා, පළාත් අමාත්‍යවරු, පළාත් සභා මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතන සභාපතිවරුන් වැනි ප්‍රජා නියෝජිතයන් සහ රජයේ නිළධාරින්ගේ සහභාගිත්වයෙන් මහජන අවශ්‍යතාවයන් සලකාබලමින් එකමුතුව කටයුතු කිරීමටත් එමගින් ජනතාවට වැඩි ප්‍රතිලාභ ලබාදෙන ප්‍රයෝජනවත් වැඩසටහන් සැකසීමට, ඒවා ක්‍රියාත්මක කිරීමට හා ඒවා අධීක්ෂණය කර ඇගයීමට ලක්කිරීමට හා ක්‍රියාත්මක කිරීමේ ගැටළු සාකච්ඡා කර විසඳාගැනීමට හැකිවන බවත් පැවසීය.

### 2. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මූලාසන කතාව

දිස්ත්‍රික්කය පුරා විසිරී සිටින ජනතා නියෝජිතයන් එක්රැස්වී සාකච්ඡා කරමින් ජනතාවගේ අවශ්‍යතා හා ගැටළු විසඳාදීමට මෙවැනි පළාත් සංවර්ධන සැසියේ දිස්ත්‍රික් රැස්වීම් ඉතා ප්‍රයෝජනවත් බව ගරු ප්‍රධාන අමාත්‍ය තුමා තම මූලාසන කතාවේදී ප්‍රකාශ කළේය. ජුනි මාසයේදී මෙවැනි රැස්වීමක් ත්‍රිකුණාමලයේදී පවත්වන ලද බවත් හෙට දින මඩකලපුවේදී පැවැත්වීමට නියමිත බවත් ප්‍රකාශ කළේය. මෙසේ අප පළාතේ වෙසෙන සියලු ජාතීන්ට තම සේවය ලබාදීමට තමන් අපේක්ෂාකරන බවත් සතුටින් ප්‍රකාශකළ එතුමා, පළාතේ සංවර්ධනය සඳහා විවිධ මුදල් මූලාශ්‍ර මගින් නැගෙනහිර පළාත් සභාවට 2013 වසර සඳහා ලැබුණ රුපියල් මිලියන 7,000 ක මුදලින් රුපියල් මිලියන 2,726 ක මුදලක් අම්පාර දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා වෙන් කර ඇති බවත් මේ සඳහා ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, JICA සහ UNICEF යන ආයතනවල මූල්‍ය ආධාරයෙන් සිදුකරන ලද ව්‍යාපෘතිද ඇතුළත් වන බව පැවසීය.

ඉතාමත් උනන්දුවෙන් හා කැපවීමෙන් රාජකාරි කරමින් සිටින පළාත් රාජ්‍ය සේවයේ නිළධාරින්ටද තම ප්‍රශංසාව පළකළ එතුමා ඒකාබද්ධ ක්‍රියාකාරකම් තුළින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල ප්‍රතිලාභ ජනතාවට ලැබෙන බවට සහතික විය යුතු බව ඉල්ලා සිටියේය. මෙසේ ක්‍රියාත්මක වීමේදී ජනතාවගේ අපේක්ෂා මුදුන්පත් වන අතර අනෙකුත් පළාත් අතර අප පළාත ඉදිරියෙන්ම සිටිනු ඇතැයිද ප්‍රකාශ කළේය.

### 3. නැගෙනහිර පළාත් සංවර්ධන වැඩසටහන

ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මූලාසන කතාවෙන් පසු නැගෙනහිර පළාත් සංවර්ධන වැඩසටහන පිළිබඳව ඉදිරිපත්කිරීමක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් විසින් සිදුකරන ලදී.

ජාතික සංවර්ධන ප්‍රතිපත්තියට අනුකූලව නැගෙනහිර පළාත් ආවේණික අවශ්‍යතා සඳහා පළාත් සංවර්ධන වැඩසටහන සකසන බව පැවසූ ඔහු ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික ව්‍යාපෘති සියල්ලම දැනටමත් ක්‍රමවත්ව සකසා ඇති නැගෙනහිර පළාත් ආයතනික ප්‍රතිඵල රාමුව (Agency Results Framework) පාදක කරගෙන සකසා ක්‍රියාත්මක කරන ලෙස හා සංවර්ධන මූල්‍ය ප්‍රතිපාදන සුදුසුලෙස දිස්ත්‍රික් අතර බෙදාදෙනු ලබන බැවින් දිස්ත්‍රික් අතර ජාතීන් අතර සහජීවනයට උදව් වන බව සඳහන් කළේය.

## 4. සංවර්ධන අංශ පිළිබඳ සාකච්ඡාව

සාකච්ඡාවට පහසුවන පරිදි පළාත් අමාත්‍යංශ පිළිවෙලින් අංශ ගොනුගත කොට එක් එක් විෂය ආරම්භයේදී අදාල අමාත්‍යංශ ලේකම්වරයා විසින් සංවර්ධන කටයුතු, ක්‍රියාත්මක වෙමින් පවතින හා අනාගත සංවර්ධන කටයුතු හා ආයෝජන වල සාරාංශ ප්‍රකාශයක් සිදුකොට සාකච්ඡාවට ඉඩලබාදුන්හ.

ඉන්පසු එක් එක් මාතෘකාව සාකච්ඡාවට ලක්කරන ලද අතර සැසිවාරයට සහභාගීවූවන් විසින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කරන ලදී.

- දැයට කිරුළ විශේෂ වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයට වෙන්කරන ලද මුදල් සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන්වලදී කල්මුණේ මහනගර සභාව ප්‍රමාණවත් ලෙස ඇතුළත්ව නොමැතිබව ප්‍රකාශ කරන ලදී. එසේම පොතුවිල් සිට කල්මුණේ දක්වා වෙරළාශ්‍රිත ප්‍රදේශ සංවර්ධන කටයුතු පිළිබඳව නොසලකා හැර ඇති බවද ප්‍රකාශ කරන ලදී. මෙම විශේෂ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම පළාත් සභාව මගින් ක්‍රියාත්මක නොකරන අතර දැයට කිරුළ ලේකම් කාර්යාලය මගින් තෝරාගෙන ඇති ව්‍යාපෘතිවලින් පළාත් සභාව යටතේ ඇති පළාත් ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන බවත් පැහැදිලිකර දෙන ලදී.

- JICA මූල්‍යාධාර යටතේ ආරම්භ කෙරෙන නව වැඩසටහනට ගම්මාන තෝරාගැනීම පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් පැවැත්වුණු අතර සමහර දෙනෙක් අසතුට ප්‍රකාශ කළහ. ආරම්භයේදී ගම්මාන විශාල ප්‍රමාණයක් පරීක්ෂාකෙරෙන අතර පසුව ව්‍යාපෘතිය මගින් ලැබෙන මුදල් ප්‍රමාණය අනුව මූලික තෝරාගැනීම, දරිද්‍රතා දර්ශකය යනාදිය සලකා බලා අම්පාර දිස්ත්‍රික්කයේ ගම්මාන පර්ෂද 05 ක් තෝරාගෙන ඇති බවත් අදාල නිළධාරීන් විසින් පැහැදිලිකරදෙන ලදී.

- තිරුක්කෝවිල් ප්‍රදේශයේ ගම්මාන 4 ක ජනතාව තවමත් නැවත පදිංචි කර නොමැති බවත් එහි අධ්‍යාපන, සෞඛ්‍ය හා මාර්ග අවශ්‍යතා විශාල ප්‍රමාණයක් ඇති බවත් මෙවැනි මූලික අවශ්‍යතාවන් හෝ ලබාදීමට ප්‍රමුඛතාව දිය යුතු බවත් ඉල්ලා සිටින ලද අතර එමගින් ජාතීන් අතර සහයෝගය වර්ධනය කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී. මීට පෙර පැවති රැස්වීම්වලදීද යළිපදිංචිකරවීම් පිළිබඳව ඉතා අඩු ප්‍රමාණයකින් මූල්‍ය වෙන්කර ඇති බව ප්‍රකාශ කළ අවස්ථාවලදී මේ පිළිබඳව මධ්‍යම රජය සමග සාකච්ඡා කොට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව ප්‍රකාශ කළත් කිසිදු ප්‍රගතියක් නැති බව අවධාරණය කරන ලදී.

- ගුරුවරුන් ලබාදීමේ අඩුපාඩු ඇති බවත් බොහෝ ප්‍රදේශවල ගුරු පුරප්පාඩු ඇති බවත් සමහර පාසල් ගොඩනැගිලි ඉදිකිරීම් තවමත් අවසන්ව නැති බවත් ප්‍රකාශ කරන ලදී. අවසන් කර නැති පාසල් ගොඩනැගිලි පාසල් 1000 ව්‍යාපෘතිය හා ඉසුරු පාසල් ව්‍යාපෘතිය යටතට ගෙන වැඩ අවසන් කරනු ලබන බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ප්‍රකාශ කළේය.

- JICA මූල්‍යාධාර යටතේ ඉදිකරනු ලබන කොන්ක්‍රීට් මාර්ග ඉතාම අඩු ප්‍රමිතියකින් යුතු බවත් ඉක්මනින් කැඩී යන බවත් බාල සිමෙන්ති භාවිතය නිසා මෙසේ සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී. මාර්ග ඉදිකිරීමෙන් පසු එම මාර්ගවල තත්ත්වය පරීක්ෂාකොට අඩුපාඩු තිබුණත් ඒවාට අදාල ගෙවීම් සම්පූර්ණයෙන්ම ලබාදෙන බව පෙන්වා දුන් අතර මෙම ක්‍රියාමාර්ග වලදී අල්ලස් ගැනීම් සිදුකෙරෙන බවටත් චෝදනා කරන ලදී. ප්‍රාදේශීය මට්ටමින් මේවා පාලනය කිරීම සඳහා අදාල දෙපාර්තමේන්තු බලධාරීන්, ව්‍යාපෘති කාර්යාල නියෝජිතයන් හා එක්ව රැස්වීමක් පවත්වන ලෙස ඉල්ලා සිටින ලදී.

- ප්‍රාදේශීය සභා වලට අදාල තාරපාරවල් නඩත්තුව සඳහා විශේෂ ව්‍යාපෘතියක් අවශ්‍ය බවත් මෙවැනි සැලැස්මක් නොමැති හෙයින් එම වීදි වලට සිදුවන හානි තවදුරටත් වැඩිවන බවත් අවධාරණය කරන ලදී.

- නාවිදන්වේලි ප්‍රදේශයේ ජලය බෙදාහැරීමේ ගැටළු පිළිබඳව සාකච්ඡා කළ අවස්ථාවේ JICA මූල්‍යාධාර යටතේ ආරම්භ කරන ලද නව ව්‍යාපෘතිය යටතේ නාවිදන්වේලි ජලය බෙදාහැරීමේ ව්‍යාපෘතියද ඇතුළත් කර ඇති බව ගරු ඇමතිතුමා ප්‍රකාශ කළේය.

- කෘෂිකර්මය මත යැපෙන අක්කරෙයිපත්තු ගොවීන්ට අක්කර 500 ක පමණ ඉඩම් ප්‍රමාණයක් අත්හැරීමට සිදුවී ඇති බවත් සම්බුකුලම්වැව ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ශක්‍යතා වාර්තාවක් (Feacibility Report) ලබාගතයුතු බවත් උපදෙස් දෙන ලදී. පීඩාවට පත් ජනතාව හා ප්‍රාදේශීය සභා නිළධාරීන් සමග සාකච්ඡාකර මෙය කෙසේ විසඳිය යුතුදැයි තීරණය කරන ලෙස ගරු ප්‍රධාන අමාත්‍යවරයා විසින් වාරිමාර්ග අධ්‍යක්ෂවරයාට දැනුම් දෙන ලදී.

- සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධන වැඩසටහන් යටතේ වෙරළ තීරයේ ඉදිකර ඇති බංකු විශාල වශයෙන් කැඩී යන බවත් මේවායේ නඩත්තු කටයුතු ප්‍රාදේශිය සභාවලටම භාරදිය යුතු බවටත් උපදෙස් දෙන ලදී. එසේ පළාත් මාර්ග අමාත්‍යංශය මගින් ලබාදී ඇති සූර්ය බල විදිලාම්පු නඩත්තු කටයුතුද ප්‍රාදේශීය සභා විසින් කළයුතු බවද ඉල්ලා සිටින ලදි.

- පොතුවිල් රෝහලේ ඖෂධවේදීන්ගේ පුරප්පාඩු වසර 4 ක සිට පවතී. නින්දවූර් ආයුර්වේද රෝහල සුදුසු ස්ථානයක පිහිටා ඇතත් එය සඳහා වෙනත් ස්ථානයක ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳව චෝදනා කරන ලදී.

- සංවර්ධන කටයුතු සඳහා මුදල් ප්‍රමාණවත් නොවන බැවින් සංවර්ධන වැඩකටයුතු කොටස් වශයෙන් සිදුකෙරෙන බවත් නින්දවූර් ආයුර්වේද රෝහල දිස්ත්‍රික් රෝහලක්ලෙස සංවර්ධනය කිරීම සඳහා ආයුර්වේද කොමසාරිස්ගේ අනුමැතිය හා සේවක සංඛ්‍යා අනුමැතිය සඳහා යවා ඇති බව ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා ප්‍රකාශ කළේය.

- අවශ්‍ය සුදුසුකම් ඇතත් තනතුරේ ස්ථිර නොකර සිටින ස්වේච්ඡා සෞඛ්‍ය සේවකයන් 15 දෙනෙකු සඳහා තීරණයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. මෙයට පිළිතුරු දෙමින් ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා 500 දෙනෙකු පමණ මෙසේ සේවය කරන බවත් දැනට කිසිවක් කළ නොහැකි බවත් අනාගතයේදී අදාල ස්ථානවලින් අනුමැතිය ලබාගෙන යම් ප්‍රමාණයක් හෝ පත්වීම් ලබාදීමට කටයුතු කරන බව දන්වා සිටින ලදී.

- පළාත් සංවර්ධන සැසියේ දිස්ත්‍රික් රැස්වීම බලධාරීන් සමග අදහස් හුවමාරුකරගැනීමට යොදාගනිමින් සුදුසු සැලසුම් සකස්කළයුතු බවත් ඇතිවන ගැටළු අභියෝග ලෙස භාරගනිමින් ඒවා ජයගතයුතු බවත් ජනතා සහභාගිත්වය තුළින් සිදුකරන පහළ මට්ටමේ සැලසුම්ද වැදගත්වන බවත් එයට ඉඩලබාදීම සඳහා බලධාරීන් ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් සමග සාකච්ඡා කළ යුතු බවත් අවධාරණය කරන ලදී.

- බලධාරීන්, ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ආදි සියලු දෙනා ජාති, ආගම් හා දේශපාලන භේදයකින් තොරව එකමුතුව කටයුතු කිරීමෙන් ජනතාවට ඉහළ සේවයක් ලබාදිය හැකි බව ගරු ප්‍රධාන අමාත්‍යතුමා රැස්වීම අවසානයේදී පැවසීය.

පළාත් සංවර්ධන සැසියේ අම්පාර දිස්ත්‍රික් රැස්වීමට පැමිණි සියලු දෙනාටම තම ස්තුතිය ප්‍රකාශ කරමින් ප්‍රධාන ලේකම් විසින් මෙම වැඩසටහන නිමා කරන ලදී.

**ඩී.එම්.එස්. අබයගුණවර්දන,**
ප්‍රධාන ලේකම්,
නැගෙනහිර පළාත.